# ආගමන සමයේ පළමුවන සතිය
# බදාදා

**පළමුවන දේව ප්‍රකාශනය** — **ඉසයියස් 25: 6–10**

යෙසයා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

*සමිඳාණෝ සිය සෙනග සනසන සේක.*
*උන්වහන්සේ සමග ප්‍රීති සන්තෝෂ වන්නට අප කැඳවන සේක.*

සියලු බලැති සමිඳාණන් වහන්සේ මේ සියොන් කන්ද මත සියලු ජාතීන් හට ඉස්තරම් මුද්‍රික පානයෙන් හා රස මසවුලින් යුත් මංගල භෝජනයක් සූදානම් කරන සේක. මෙහි දී උන්වහන්සේ සියලු ජාතීන් වසා ගෙන පැවති දුක නමැති වලාකුළ පහ කරන සේක. මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මරණය සදහටම විනාශ කර දමන සේක. සියලු මුහුණු වලින් කඳුළු පිස දමන සේක. ලොව මුළුල්ලේ තමන්ගේ සෙනගට අත් වී තිබෙන නින්දාව පහ කරන සේක. මෙසේ වදාරන්නේ සමිඳාණන් වහන්සේම ය. එසේ සිදු වූ විට සියලු දෙනා මෙසේ කියනු ඇත. "බලන්න, මේ අපේ දෙවියන් වහන්සේ ය. උන්වහන්සේ අප ගලවා ගන්න සේකැ යි බලාපොරොත්තුවෙන් සිටියෙමු. උන්වහන්සේ අපේ සමිඳාණන් වහන්සේ ය. උන්වහන්සේ අප ගළවා ගත් බැවින් අපි ප්‍රීති සන්තෝෂ වන්නෙමු." සමිඳාණන් වහන්සේ සියොන් කන්ද ආරක්‍ෂා කරන සේක.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 23 : 1–2, 3–4, 5–6 |
|---|---|

පිළිතුර: සමිඳුන්ගේ නිවාසය මාගේ සදාතන වාසය වන්නේය.

ගීය: සමිඳාණෝ මා එඬේරාණෝ ය. අග හිඟ මට නොවන්නේය.
එතුමාණෝ සුනිල් තණ බිම් මත මා සතප්වා, නිසල දිය වෙත පමුණුවා,
මා පණ ගන්වන සේක. සිය නාමයේ මහිමය සැලසෙන ලෙස
දමිටු මඟ මා ගෙන යන සේක.

මරණය වැනි ගන'ඳුරු රුදුරු නිම්නය මැදින් ගියත් ඔබ
මා සමඟ බැවින් මට කිසි බියක් නොවන්නේය.
ඔබේ කෙවිට ද සැරයටිය ද මා නියත සැනසිල්ල වන්නේය.

ඔබ මාගේ සතුරන් ඉදිරියේ දී, මංගල බොජුනක් පිළියෙල කර දී
මා සිරස තෙලින් ආලේප කරන සේක.
මාගේ කුසලාන උතුරා යන්නේය.
ඔබේ දයාව හා කරුණාව නියතව, දිවිහිමියෙන් මා අනුව එන්නේය.
සමිඳුන්ගේ නිවාසය මාගේ සදාතන වාසය වන්නේය.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
සමිඳාණෝම අප පාලනය කරන රජාණන් වන සේක.
අප විනිශ්චයකරුවාණන් වන සේක. එතුමාණෝ අප පාලනය කර අප ආරක්ෂා කරන සේක.
ආලේලූයා!

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

*ක්‍රිස්තුස් වහන්සේ රෝගීන් සුව කරමින් සමූහයා සනසන සේක.*

ජේසුස් වහන්සේ ගලීලයේ මුහුද ළඟට ගොස් කන්දකට නැගී වැඩහුන් සේක. මහත් ජනකායක්, කොරුන් ද අබ්බගාතයන් ද අන්ධයන් ද ගොළුවන් හා වෙනත් බොහෝ දෙනෙකුන් ද රැගෙන, ජේසුස් වහන්සේ වෙත අවුත් ඔවුන් උන්වහන්සේගේ පාමුල තැබූහ. උන්වහන්සේ ඔවුන් සුවපත් කළ සේක. එවිට ගොළුවන් කතා කරන බව ද, අබ්බගාතයන් සුවපත් වී ඉන්නා බව ද, කොරුන් ඇවිදින බව ද, අන්ධයනට ඇස් පෙනෙන බව ද දුටු ජනකාය පුදුම වී ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ.

ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් තමන් වෙතට කැඳවා "මේ සමූහයා ගැන මට ඉතා කණගාටු ය. ඔව්හු දැන් තුන් දවසක්ම මා සමඟ ය. ඔවුන්ට කෑමත් නැත. ඔවුන් බඩගින්නේ පිටත් කර යවන්ට අකමැත්තෙමි. එසේ යැව්වොත් මඟ දී ඔවුන් ක්ලාන්ත විය හැකි යැ"යි වදාළ සේක. ශ්‍රාවකයෝ උන්වහන්සේට කතා කොට, "මෙතරම් මහත් සමූහයකට සෑහෙන තරම් කන්න දීමට මේ පාළුකරයෙහි අපට කෑම කොයින්දැ"යි ඇසූහ.

ජේසුස් වහන්සේ කතා කොට, "ඔබ ළඟ රොටි කීයක් තිබේදැ"යි ඇසූ සේක. "රොටි සතකුත් කුඩා මසුන් ස්වල්පයකුත් ය"යි ඔව්හු කීහ. උන්වහන්සේ සමූහයාට බිම ඉඳගන්න අණ දී, රොටි සත ද මසුන් ද ගෙන තුති පුදා, කඩා, ශ්‍රාවකයන්ට දුන් සේක. ශ්‍රාවකයෝ ඒවා සමූහයාට දුන්හ. හැම දෙනම කා සෑහීමට පැමිණිය හ. ඔවුන් ඉතිරි වූ කෑබෙලි එක් කොට කුඩ සතක් පුරවා ගත්හ.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*